UNEDITED SAMPLE PAGE

# හෝපලූ කුසුම

ස්වර්ණා කාන්ති පෙරේරා

UNEDITED SAMPLE PAGE



## ස්තූතිය

පුණ්‍යවන්තයින් සහ පුණ්‍යවන්තියන් විසින් පෝෂණය කරන ලද ලෝක ඉතිහාසයේ යුග යුග තුඩ තුඩ රැව් දෙන අසිරිමත් ප්‍රේමයන් පිළිබඳ බරසාර යමක් නොලියමි.

ත්‍රිමාණ ප්‍රකාශන ආයතනයේ සම අධ්‍යක්ෂකවරුන් වන මහේෂ් ගුණරත්න මහතා සහ උත්පලා මධුවන්ති මහත්මිය ඇතුලු මෙයට දායක වූ සැමට ස්තූතියි!

ස්වර්ණ කාන්ති පෙරේරා
ඒ 15/1, "ජයන්ති"
පැණිහෙල
වේවැල්දෙනිය
0771251183
0721091750
gkanthi1020@gmail'com

ත්‍රිමාණ ප්‍රකාශන

## 1 පරිච්ඡේදය

මලය රට වටා පිහිටි උස් කඳු පංති එරට රකිනා යෝධයින් සේ අහස සිඹිමින් අභීතව නැගී සිටී. කොත ආකාරයට පිහිටි කඳු හෙයින් කොත්මලය වූ පෙදෙස දළ ඇතෙකු ගජමුතු සුරකින සේ ඉතිහාසයේ රස රහස් කොතෙක් නම් සඟවා සිටීද, ඒ හරහා ගලන කොත්මලේ ඔය ද්‍රෝනි ආශ්‍රිත කෙත්වතු සරුසාර කරමින් ජයග්‍රාහි ලීලාවෙන් ඉදිරියට ඇදේ. කොත්මලේ ඔය කේන්ද්‍ර ගතව ගොඩනැගුනු තිරසාර ස්වයං පෝෂණය මලය රටේ අදීන බව ත්‍රිසිංහලයට හඬගා කියයි.

පුසුල්පිටිය විහාරයේ සිට ඍජුව ඈත බලන අයෙකුට කෙලින්ම දිස්වන්නේ මාවෙල ගම්මානයයි. රණමුන පිහිල්ල දෙස්සහිටිය, අඹහිටිය, රජඇල හා තවත් කුඩා ගම් රාශියකට යාව මාවෙල ගම පිහිටා ඇත. උදෑසන මිහිඳුම් සළු පිළි හැඳ පැළඳි දුම්බර කඳු පංති සිත්තරකු විසින් අඳින ලද භූමි දර්ශනයක් සේ මාවෙල ගමට පෙනේ. රන්වන් පලසක් ඇතිරුවා සේ පේනකෙත්මානයේ දිස්වන දුම්බර කෙත්යායේ පැසුනු ගොයම දැක සිත පහදා ගන්නට මෙන් උදා හිරු දුම්බර කඳුවැටිය දෙසින් යන්තමට හිස නගයි.

පළාත් දෙකක් වෙන් කොට දක්වන ගලෙන් බැඳි කපොල්ලක් වැනි දෙහදු කඩුල්ල අසලින් මේ වනවිට ගැල් ගාලක් ගමන් කරයි. ගැල සාත්තු නායක තෙම කෙවිටෙන් ගොනුන්ට තලන හඬත් ගොනු ගෙල බැඳි ගෙජ්ජි හඬත් එකිනෙකට මුසු වී හාත්පස දෝංකාර දේ. ඒ මලය රටෙන් එපිටට වෙළෙඳාම පිණිස බඩු භාණ්ඩ පටවා යන වෙළෙඳ ගැල් කණ්ඩායමකි. අවසානයට ගමන් කරන ගැල එක් වංගුවක් ගෙන ඉදිරියට යද්දී අතරමගදී ඊට ගොඩ වූ කොළු ගැටයා ගල්කරුගේ කනට කර යමක් කොඳුරයි. තෝන් ලනුව එහා මෙහා කොට ගොනුගේ වේගය පාලනය

UNEDITED SAMPLE PAGE



කරමින් ගැල්කරු මුව තුළ වූ බුලත් හපය වමාරමින් මෙසේ කියයි.

"මේ ඉසව්ව අයත් වන්නේ යක්ෂ ගෝත්‍රිකයින්ට, නාග ගෝත්‍රිකයින් සුළු පිරිසක් ද ඒ අතර වාසය කරනවා. ඔබට මේ පළාත නුහුරුයි වගේ."

ඊට පිළිතුරක් නොදී ගැල නවතන අතරේ දෙහඳු කඩුල්ල අසලින් දනි පනි ගා කරත්ත පාරට පැන ගත් කොළු ගැටයා මෙතෙක් වේලා උරහිසින් රැගෙන ආ ගැඹුරු පන් මල්ල දකුණතට මාරු කර සැකමුසුව සිව් අත බලන්නට විය. පේන තෙක් මානයක මිනිස් කටහඬක් හෝ මිනිස් රුවක් දක්නට නැත. ලඳු කැළෑවක තණ උලා කමින් හිඳිනා ගව රැලක් ඈතින් පෙනේ. සුළු වේලාවක් එතැන කල් මරමින් හිඳ කිසිවක් නිසැකව අවබෝධ කොට ගත් ඔහු පළාත් මායිම් කපොල්ල අසල තරමක් උසට තනන ලද ගල් බැම්ම වෙත ආසන්න වූයේ සොරෙකු මෙනි. පන් මල්ලේ වූ බරැති යමක් ඉන් පිටතට ගෙන කිසිවකුගේ දෑසට හසු නොවන මානයක එය සඟවා තැබුවේය. පන් මල්ලේ බර සැහැල්ලු වූ තැන එය එහා මෙහා වනමින් ඉදිරියට ඇදුනේ අරමුණකින් තොරවය.

පෙරදා ඇරඹූ ගමනේ ගමනාන්තය මැණියන් කියා දුන් වංහුං අනුව සිදු වූ බව සහතිකය. ඇය තනා දුන් බත්ගෙඩිය ඊයේ දිනට සෑහුනද මේ වනවිට කුසගින්න දැඩිය. ධාන්‍ය මළු අතර ගැලේ සිරව ආ ගමන හෙයින් සිරුරේ කැසීමක් හට ගෙන ඇත.

කරලින් බර කුඩා වෙල් යාය ඉහත්තැවේ පිහිටි පිහිල්ලකින් ජලය ගලා හැලෙන හඬ ඇසේ. වෙල් නියර මත දෙපා තබමින් හේ එදෙසට ඇදුනි. නියරින් වන අතට ගොඩවෙද්දී දුටුවේ දිරාගිය කොටයක් මත හිඳ මහලු කාන්තාවක් කටේ ඉතිරි වූ දත් දෙක තුන දැහැටි කූරකින් මදිමින් සිටින අයුරුය. අමුත්තා දුටු සැණින් අතේ වූ දැහැටි කූර ඉවතට දමමින් ඈ ඔහු දෙස බැලුවේ පුදුමයෙනි. එය මායිම් නොකළ කොළු ගැටයා පිහිල්ල යට හිස තබා හොඳින් නා පසෙක තැබූ පන් මල්ලෙන් රෙදිකඩක් ගෙන හැඳ සළුවකින් හිස පිසදමා එයම ජටාවක් සේ හිසවට බැඳ ගනී. පසුව තෙතබරිත ඇඳුම් හොඳින් මිරිකා අසල පඳුරකින් හබරල





කොළයක් කඩා එහි දවටා ගනී. මැහැල්ල කොළුවාගේ ක්‍රියාව දෙස බලා ඔච්චමට මෙන් සිනාසුනි.

"හබරල පතේ විසට ඇඟ කසා පලු මතුවේවි."

ඔහු හබරල පත පසෙකට දමා තෙතබරිත ඇඳුම් පන් මල්ලේ ලා ගත්තේය.

"මේ ඉසව්වේ ඇත්තෙක් නම් නෙවෙයි."

"උඩු නුවර පළාතේ."

"යක්ෂ ගෝත්‍රික නෑයින් හොයාගෙන ආ ගමනක් වෙන්ටැ"

"නැහැ. කුලියක් හොයාගෙන සැවුලන් හඬලන්ටත් කලින් ගමින් පිටවුණේ. ආයිත් නොයන්ටම ආ ගමනක්."

"හිතුවක්කාරයෙක් හැඩයි."

මැහැල්ලිගේ අවධානය වෙනතට යොමු කරමින් කොලු ගැටයා ජල පිහිල්ලට ඔබ්බෙන් වූ කැලය දෙසට අත දිගු කරමින් යමක් විමසයි.

"අර පාලුවට ගිය ගඩොල් ගෙයි මට නවාතැන් ගන්ට ඇහැක් වෙයිද අත්තම්මේ."

"ගමරාළ ගොයිය කොහොමටවත් ඒ අදහසට කැමැති වෙන එකක් නැහැ. අම්බලමක් වගේ පෙනුනාට ගමේ ඇත්තක් වුණත් ඕකට වදිනවාට ඒ ගොයිය මනාප නැහැ. කොත්මලේ කියන්නේ දරුවෝ ස්වල්ප ඉතිහාසයක් ඇති ඉසව්වක්ද? පඬුවස් දෙව් රජ්ජුරුවන්ගේ දිවිදෝස අහක් කොරන්ට කොහොඹා කංකාරිය ලකලෑස්ති කොලෙත් මේ ඉසව්වේ නැකැත් කාරයො."

"යකෙක් කන්ට කුසගිනියි අත්තම්මේ."

ඔහු කීවේ මැහැල්ලගේ ඉතිහාස කතා මායිම් නොකරන බැව් හඟවමිනි.

"ධාන්‍ය හැලියක් උදෑහැනැක්කේ ලිපේ තියලයි දත කට මැදල සුද්ධ පවිත්‍ර වෙන්ට පීල්ල දිහාවට ආවෙ. දවල් වෙද්දී ගම්මු පිරෙනවා මෙතැනට."

ඇය එසේ පවසන විටත් එකා දෙන්නා වෙල් නියර දිගේ

UNEDITED SAMPLE PAGE



දිය පීල්ල දෙසට එමින් සිටියහ.

"කවුදෑ උක්කු අම්මේ මේ උදෑහැනැක්කේ මුලිච්චි වුනු අපූරු ගැටයා."

"කුලියක් හොයාගෙන උඩුනුවරින් ආවැයි කියන්නේ."

"වැඩි ඇතක නොවේ එහෙනං. වැඩපොළට දක්ෂ බව නම් කොලුවගේ ඇඟෙං පේනවා. "

කොලු ගැටයාගේ ඉහළ සිට පහළට බලමින් වැඩිහිටියකු එසේ කියයි.

වරිච්චියෙන් තැනූ පැල්පත ඉදිරිපස රියනක් පමණ උසින් හා ඝනකමින් යුත් පිලකි. පිල මත අඩක් වියන ලද ගල්ලැහැ පැදුරක් රාත්‍රී තෙතමනය උරා ගැනීම පිණිස එළා ඇත. ඇතුළු ගෙය දහවලේ ද කළුවරින් යුක්තය. වහලේ ඉරට බේරුනු පොල් අතු අතරින් යන්තමට එබෙන හිරු එළිය අඳුරට පහනක් දැල්වූවා වැනිය. පෙරදා වැසි හෙයින් ගොම මැටි ඇතිරූ ගෙබිම තෙමී පලින් පළ හිල් මතු වී තිබේ. මැටි කෝප්ප, වළං, මුට්ටි කිහිපයක වැසි දිය එකතු වී ඇත. පැදුරු ආනක්, ලණු ඇඳක්, දිරාගිය පෙට්ටගමක් හැරෙන්නට ඇතුළු ගෙයි කිසිත් නැත. උයන ගෙය ඇතුළු ගෙයට වඩා කළඑළිය. ඒ කිතුල් පළු වලින් තැනූ පියන් රහිත ලොකු කවුළුවක් ඇති නිසාය. දුමට පහළින් වූ ලිපේ කොල්ලු හැලිය තවමත් තැම්බෙමින් තිබේ. උයන ගෙට යාව එළිමහනේ කළගෙඩි මැස්ස හා වළං මැස්සය. උයන ගෙයි පසෙක ගොම තවරා පදම් කළ විශාල බටපොතු වී පෙට්ටියකි. කොලු ගැටයා ආගන්තුක බවක් නොපෙන්වමින් ඉදිරි උළුවස්සෙන් පැල්පතට ඇතුළු වී පිටුපස උළුවස්සෙන් කොන්ද නමා පිට වී අවට පරිසරය නරඹන්නට විය. ඒ අතර උක්කු අම්මා කොළපතට බෙදූ කොල්ලු කොච්චි මැල්ලුමක් සමඟ දුම් දමමින් රැගෙන එද්දී මෙතෙක් වේලා දැනෙමින් තිබූ කුසගින්න බඩ දැවිල්ලක් වී ඇවිලුනේය. කුස පිරෙද්දී සිතද පිරෙන බව ඔහුට දැනුනේ ය. සප්පායම් වී කළගෙඩි මැස්සේ මුනින් අතට නමා තිබූ පෙරංගාන ලද අලුත් පොල්කටුවකට නැවුම් මැටි කලයෙන් සීතල වතුර පානය කරද්දී කොලු ගැටයාට ඇති වූ සතුට නිම්හිම් නැත. තමා මෙතෙක් අනුභව කළ රසවත්ම ආහාරය එය බැව් ඔහුට දැනී ගියේය.

මැහැල්ල ගැටයා වෙහෙසට පත් කරමින් ඇසූ දෑ





බොහෝ ය. අවසානයේ ඇය නොසතුටු මුහුණින් මෙසේ කීවාය.

"ඉබ්බාගෙං පිහාටු ගත්තත් ඔය දරුවගෙන් වචනයක් ගන්ඩ බැරි හැටි. කියහංකො නමවත්. "

"ගුත්තා "

"ඒක, ගුප්තා වෙච්චිනං අපූරුයි."

මැහැල්ලට යමක් වැටහෙන බව ගුත්තාට තේරුම් ගියේය.

"නාකි මමත් එක්කල ඕන කාලයක් මේකේ වැටිල ඉන්ට ඇහැකි. මගේ එකම කොලු පෙළවහක් කොරගෙන අටවා ගත්තු පැල්කොටේ තමා අර ඇතින් බැද්දට යටවෙලා යන්තමට පේන්නේ. "

ඇය පැලට ඉහළ තරමක් උස් භූමියක පිහිටි කටුවැල් ගාලකින් වැසී තිබූ ඉලුක් වහලයක් දෙසට අත පාමින් කියයි.

"ඒ ඇත්තො දෙන්න දියුණු වෙන්ටය කියා මාගම් පුරේට පලච්චි.ඕක සිද්ධවෙලා හුඟ කාලයක්. මේ වනතුරු හෝඩුවාවක් වත් නැහැ. ඒක සුද්ද පවිත්‍ර කොරගෙන ගහක් කොළක් හිටෝගෙන හිටියට කාරි නෑ. මගේ ජීවිතෙත් අදද හෙටද විශ්වාස නැති එකේ මියැදෙන කොට අපි ඕව කර තබා යනවයැ. "

බැද්දට යට වූ ගෙපැල කැලේ කපා පාදා වහලයට අලුත් පිදුරු සෙවිලි කොට ගෙමැද්ද තලා ගොම මැටි ගෑ කල යනඑන මං නැතිව හුන් ගුත්තාට එය දෙව් විමනක් තරමට වටී. ගත වෙහෙසා පොළොවේ පස පෙරලා වගා කළ දෑ අතු ඉති ලියලා මල් එල මෝදු වනවිට ඔහුගේ සතුට නිම්හිම් නැති විය. ඒ අතර ගම්මානයේ අයවලුන් හට අයත් ගවරැළ පාලනය කිරීම ද ගුත්තාට පැවරුනි. කොත්මලේ නිම්නයේ ඇතින් ඈතට ගවරැළ දක්කා යන අතරේ ගමේ හයි හත්තිය ඇති ගැටවරයින්ගේ උසුළු විසුළු වලට ද ගුත්තා නොයෙක් වර ලක්වේ.

"හූ... හූ... හූ... ගොමබෙටි අල්ලන හිද්දලයා."

ගුත්තා ඒ කිසිත් මායිම් නොකළේ ය.

නෙරිය තියා රතුමල් චීත්තයක් හා කර ගැඹුරට කැපූ හැට්ටයක් හැඳ දිය නා වරල උනා උක්කු අම්මාගේ පැලට ආ

UNEDITED SAMPLE PAGE



ගැටිස්සිය පිල්කඩ මත බත් ගෙඩිය කමින් හුන් ගුත්තා දෙසට ඉඟි මැරීය. ඒ අතර උක්කු අම්මා තිබ්බොටු මැල්ලුම් හට්ටියද රැගෙන ගුත්තා අසලට ආවේ අඩුක්කුවට අඩුපාඩු බෙදන්නටය. ගැටිස්සිය දුටු පමණින් ඇය හට්ටිය ගුත්තා අසල පිල්කඩෙහි තබා ඈ හා ආ ගිය තොරතුරු කතාව ඇරඹීය.

"පලිඟු මැණිකේ නොවැ. කවුද අප්පේ මෙහෙට්ට පාර කිව්වේ. "

"අත්තම්මා බලා කියලා යන්ට හිතුණා. "

ඇය එසේ කීවේ සප්පායම් වෙමින් පිල මත හුන් ගුත්තා දෙසට සොර බැල්මක් හෙලමිනි.

"නාග ගෝත්තරේ පවුල් කීයෙන් කීයද මේ වැයික්කියේ වාසය කොරන්නේ. උන් ටික දෙනා අතර සමගියක් සමාදානයක් නැති හැටි. හන්දිපත් රුදාවට රැට රැට තෙල් බෙහෙත් සාත්තුව කොරගන්ට ගෑනු දරුවෙක් හිටියනං කියලා නමෝ විත්තියෙං හිතෙනවා. උඹලා අප්පච්චි මගේ බෑණා. ඒ කියන්නේ එක කුසේ උපන් අක්කණ්ඩිගෙ පුත්තරයා වුණත් නාහෙට නාහන මිනිහා විත්තිය උඹ දන්නවනෙ කෙල්ලෙ. එහෙම නොවිච්චි මට උඹව කැන්දගන්ට තිබුණා නොවැ මයෙ තනි නොතනියට."

"අප්පච්චි ගැල් ගාලක් එක්කලා කොත්මලෙන් පිටවුණේ ඊයෙ දොහේ. ඒ සුනංගුවෙන් අත්තම්මව බැහැ දකින්ට ආවේ. මේං අම්ම හල් පිට්ටු මුලකුත් බැඳලා දුන්න අත්තම්මට දෙන්ටයි කියලා."

පළිඟු මැණිකා කෙසෙල් පට්ටාවලින් තදට බඳින ලද කොලපතක් උක්කු අම්මා අත තබයි.

"මේ කරුමක්කාර ලෙඩේ නොතිබුණනං මයිලක දුර කජ්ජක් නොවැ. රටා දමල වියාපු අපූරු පැදුරක් ඇති. පස්සෙං පහු යනකොට මතක ඇතිව ඒකත් ඇන්න පලයන්. "

ඒ වනවිට ගුත්තා සප්පායම් වී අවසන්ය. කලගෙඩි මැස්ස දිහාවට ගොස් වතුර පොල්කටු කිහිපයක් බී අහවර වූ තැන කුස තුළින් ගොජ ගොජ හඬක් නැගෙන්න විය.

මිත්තනිය හා මිනිබිරිය අතර කතාවට බාධා නොකර ගුත්තා කඳු ගැටය මත වූ තම පැල වෙත යන අතරේ පළිඟු





මැණිකා මිත්තනියගෙන් යමක් අසනු ඇහී මදකට නතර ව එය අසා සිටියේ ය.

"කවුද අත්තම්මේ ඒ අය්යණ්ඩි. "

"උඩු නුවර පළාතෙ ගැටයෙක්. නවාතැනක් සොයද්දී මම මෙහේ නතර කොරගත්තා. කම්මැලි කමක් ගෑවිලාවත් නැති හොඳ දෂ්ය දිෂ්ඨි කොලුවා. මාවෙල ගමේ විතරක් නොවේ. අහලගං හතේම වැඩපළවලට උදව් පදව් කොරනවා. බඩිං වදාපු එකා අන්ධ සංසාරයක් නැතිව වහං වෙලා යද්දී මේ ඇත්තා මගේ පූරුවෙ ණයකාරයෙක් වෙන්ටත් බැරි නැහැ. "

"අත්තම්මට නොකියා හිටියට අප්පච්චි අම්මත් එක්කල දබර වෙලා ආයි නොඑන්නමයි කියාලා පොළොවේ අත් ගහල දිවුරල කරත්ත රස්සාවට ගියේ. අම්මත් ඒවි. මමත් පුළු පුළුවන් විදිහට ඇවිත් යන්ට එන්නං අත්තම්මේ. "

"ඉර කන්දෙන් නොපෙනී යන්ටත් ළඟයි වගේ. පරිස්සමට පලයන් පළිඟු දුවේ. "

ඇය අත්තම්මාගේ දෙපා වැඳ රටා පැදුරද කිසිලි ගන්නා ගෙන අඩිපාරේ මද දුරක් ඇවිද ගියාය. මෑ වැල්වලට රිටි ඉන්දවමින් කඳු බෑවුමේ හුන් ගුත්තා දැක බිමට නැමී අහුලා ගත් ලොකු ගල් කැටයක් පඳුරක් වෙතට වේගයෙන් දමා ගැසීය. ඔහු කරමින් හුන් වැඩය නවතා හඬ ආ දෙස බැලීමේ දී පළිඟු මැණිකා දුටුවේ ය. ඇය මුහුණේ භීතියක් මවාගෙන කතා කරයි.

"සර්පයෙක්. "

"මම තාම මේ ඉසව්වේ සර්පයෙක් දුටුවේ නැහැ "

"සර්පයො එන්නෙ කලින් දැනුම් දීලා නෙවෙයි "

"ඒකත් එහෙමයි නේද? "

"මම යනව අය්යා "

පළිඟු මැණිකාගේ පිරිපුන් ලැමත් හීන් දිගැටි දෑසත් පිට දිගට මුදා හළ වරලසත් අතරේ තමාගේ සිත පැටලුනා සේ ගුත්තාට දැනුණි. පළිඟු මැණිකාගේ රුව කුඩා අඩි පාරේ ඈත සිහින් රේඛාවක් වී නොපෙනී යනතුරු ගුත්තා අසිහියෙන් මෙන් බලා හුන්නේ ය. පසුව හිස දෙපසට වනා යළි කරමින් හුන්

UNEDITED SAMPLE PAGE



කාර්යෙහි නිරත විය.

පළිඟු මැණිකා අත්තම්මාගේ තනි නොතනියට ගම් තුලාන දෙකක් පහු කරමින් නිතර නිතර මාවෙලට ආවාය. ඈ එසේ එන බොහෝ වේලාවට ගුත්තා පැල් කොටේ හෝ අහලක නොසිටියේය. ඈ අත්තම්මාගෙන් ඒ ගැන කිසිවිටෙකත් කෙලින් විමසුවේ නැත. ඊට හේතුව කෙනක් හැරෙන විට ද අත්තම්මාට ඒ හැරෙන්නේ කුමකට දැයි කීමට තරම් කල්පනාවක් ඇති නිසාය.

උක්කු අම්මාගේ පැල් කොටේට ඩිංගිත්තක් ඉහළට වන්නට පුංචි කඳුගැටයක පිහිටි ගුත්තාගේ පැල වෙත මොහොතක්බලා හුන් පළිඟු මැණිකා එය මුවාවට තබා තිබූ පොල් අතු දොර පළුව විවරව ඇති බව දැන ඒ දෙසත් කුඩා කඳු ගැටයේ තැනිත් තැන පඳුරු ලෙස වැවී තිබුණු සැවැන්දරා ගාල දෙසත් බලමින් මිදුලේ වී පැදුර අකුලමින් හුන් මැහැල්ලට ඇසෙන සේ මෙසේ කීවාය.

"සැවැන්දරා ගස් ටිකක් උදුරන් යනවාය කියලා හැමදාම හිතාගෙන එනවා. ඒත් අමතක වෙනවා. "

"මක්කටෙයි "

"හිටෝගන්ඩ. අවුරුදු ගානකට කලින් අම්මා අත්තම්මගෙ න් ගෙනිච්ච සැවැන්දරා මුල් ටික තාම ඒ වගේම තියෙනවා. ඇඳුම් පෙට්ටගම ඇතුලෙ. බොරුනං මේං බලන්ඩ චීත්තෙ ඉඹලා"

ඇය තමා ඇඳ දුන් චීත්තය උක්කු අම්මාගේ නැහැයට ළං කරයි.

"සැවැන්දරා පුසුඹ ගැන උඹ මට අමුතුවෙන් කියා දෙන්ඩ කාරි නැහැ. ආං යකඩෙ උයන ගෙයි මුල්ලක ඇති. වී පැදුර අකුලලා මම යනව ටිකක් ඇලවෙන්ට"

තට්ටු ආකාරයට තනා ඇති ගල්වැටි පේළි අද්දර සැවැන්දරා පඳුරු සරුවට වැවී තිබේ. පළිඟු මැණිකා චීත්තය කෙටි වන ලෙස ඇඳ ගල්වැටිය නැග කැස්සක් කැස්සේ අත්තම්මා වී පැදුර අකුලා පැලට ගිය බව නිසැකව දැනය. දෙස්සහිටිය, අඹහිටිය ගම් දෙකේ ගොයම් කැපිලි පැගිලි අහවර වූයේ අද දින එළිවන ජාමයේය. දවස් ගානක් එක දිගට අම්බරුවන් දක්කා, උන්ට කෑ ගසා උතුරු දණ්ඩ බැරැන්ඩි වී ඇත. එළිවෙන ජාමේ විත් අත්තමාගේ කුරහන් කැඳ පොල්කටුව බී ගොම





මැටි පොළොවේ දිගා වුණා දිගා වුණාමය. හෝරා කීයක් නම් ගතවුණා දැයි නොදැනිණ. කෙනෙකු කිහිප විටක් කහින හඬින් ගුත්තා ඇඟමැලි කඩා වහා අවදි විය. පපුවේ මවිල් ගස් අතින් පිරිමදිමින් ගෙපැලේ උළුවස්සේ සිට පහළ බැලුවේය. පළිඟු මැණිකා ගල්වැටිය අද්දර සැවැන්දරා පඳුරු හා ඔට්ටු වෙමින් හිඳී. ගුත්තා ගල්වැටි කිහිපයක් බැස පළිඟු මැණිකා අසලට ආවේය.

"අමාරුයි අය්යණ්ඩි වැඩේ. ගල් ඇතුලට වෙන්ට මුල් ඇදල තියෙන්නේ "

ඒ වනවිටත් ඇගේ නළලින් දහඩිය බිඳු පහළට ගලමින් තිබුණි. ගුත්තා යකඩය ඈ අතින් ගනිද්දී දෙදෙනාගේ දෑත් එක පැටලුනි.

"අය්යණ්ඩි.. "

"නගා... "

ගුත්තා ඇගේ බඳ වටා දෑත් යවා ඈ තම ළමැදට තුරුළු කර ගත්තේය. ගැහැනියකගේ ස්පර්ශය තුළ මෙපමණ සුවයක් ඇතැයි ඔහු හැඳිනගත්තේ මේ මොහොතේය. කුරුල්ලෙකුගේ පියාපත් යට උණුසුම් වන කිරිලියක සේ ඕ ඒ ඉරියව්වෙන් කොතෙක් වේලා සිටියාදැයි ඇයට මතකයක් නැත.

ගුත්තා උල් යකඩයෙන් පඳුරට ඇන සැවැන්දරා පැළ මතු කර ගනී. පළිඟු මැණිකා ගල්වැටිය මත දිගු කල්පනාවකට බරව හිඳී.

"මොනවද නගා කල්පනා කොරන්නේ "

"අය්යණ්ඩිට මේ ඉසව්වෙ බොහෝමයක් ඇත්තො මනාපයි. ඒත්... "

"සඟවන්නෙ නැතුව කියන්ට නගා "

"සමහරක් ඇත්තො අය්යණ්ඩි ගැන අදටත් සැක සංකාවෙන් ඉන්නේ "

"ඒකට හේතුව අහවල් දෙයක් කියලා ද නගා හිතන්නේ"

"ටික කාලෙකට ඉහත ඕං ඔය සිරිපාදෙ අඩවියෙ දිහායිංය කියල අයියට සමාන ගැටවරයෙක් මේ පළාතට සේන්දු වුණා. අහලගං හතේම වැඩ පළට උදව් පදව් කොරල හැමෝගෙම හිත්

UNEDITED SAMPLE PAGE



දිනා ගත්තා. ඒත් අවසානයට වුණේ කවුරුත් නොහිතපු දෙයක්"

"ඒ මොකක්ද? "

"ඒ යෝධයා නමගිය මිනීමරුවෙක්. ගිලිමලේ පැත්තේය කියල කඩු කස්තාන පැළඳ ගත්තු තානාන්තර දරන්නෝ කිහිප දෙනෙක් තරමක සේනාවක් සමඟ ඇවිත් මිනිහව කුදලගෙන ගියා. ගිනි පෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරියටත් බයයි."

"ඒ කතාව ඇත්තයි නඟා "

"හුඟක් වේලා මෙතන කල්මැරුව අය්යණ්ඩි. අත්තම්මගෙ ඇහැ ගැටුනොත් අපි දෙන්න මෙහෙම කතා කරන එක හොඳ නැහැ."

පළිඟු මැණිකා උල් යකඩයත් සැවැන්දරා පැළ කිහිපයක් රැගෙන ගල්වැටි එකින් එක් බසිමින් උක්කු අම්මාගේ පැල්කොටය දෙසට යන අයුරු ගුත්තා යන්තම් සිනහවක් මුව රඳවා බලා හුන්නේ ය.





## 2 පරිච්ඡේදය

කුලියක් සොයා උඩුනුවර පළාතේ සිට අනාථයෙකු සේ කොත්මලේ ඉසව්වට පැමිණි ගුත්තා මුලින් ගොම්පස් ඇල්ලුවේය. හිද්දලයා, ගොපල්ලා වී තැන් තැන් හි සැරිසැරුවේ ය. උක්කු අම්මා මියැදුනාට පසු මාගම් පළාතට වහංවුනු පුත්‍රයා ඔහුගේ අයිතිය කියා ගුත්තා පදිංචිව හුන් ගෙපැල අයිතිකර ගත්තේ ය. පුදනකොටම කාපි යකා කියන්නා සේ පළිඟු මැණිකා හා බැඳුනු ආල කතාවද පුස්සක් විය. පළිඟු මැණිකාගේ අප්පච්චි ගුත්තා හමුවට පැමිණ ඔහුට තර්ජනය කළේය.

"ඉන්ට හිටින්ට තැනක්, කුල ගෝත්තරයක් නැති එකෙකුට මගේ කෙලි දෙන්නේ නැහැ ආයුබොවං කපල ගඟක මුහුදක දැමීමත්. අපි නාග ගෝත්‍රයෙ ඇත්තො. "

උක්කු අමාමාගේ මලගමටවත් පළිඟු මැණිකේ නාවේය. ගුත්තා රෑ දෙගොඩහරි යාමයේ නාන පිහිල්ලට ඉහළින් තිබූ අම්බලමේ පැදුරු කඩක් එළා නිදා ගත්තේ ය. උදේ රැයින් අවදිව පිහිල්ලෙන් නා ගම පුරා ඇවිද වැඩපළ කළේය. ගුත්තාගේ හොඳම මිතුරන් වූයේ ගවරැළ හා අම්බරුවන්ය. උන් ගුත්තාගේ අණට කීකරු වනු දුටු ගම්මු විටෙක පුදුම වූහ. ඉදිරි කාලයේ දී ගුත්තා මාවෙල ගමේ ගංකාරයෙක් පට්ටිරාළ කෙනෙක් වේදෝයි ගම්මු සැක පහල කළහ.

ගවරැළ තෘණ යායට දක්කා ඇතැම්විට ගුත්තා ඒ අසල වූ විහාරය වෙත පියගැට පෙළ නගී. එසේ යන්නේ ගාථාවක් ද සෙමෙන් මුමුනමිනි.